# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2017

## නීති විද්‍යාව

(පැ තුනයි)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

1. වත්මන් ලෝකය පාලනය කරනු ලබන සංකල්ප බොහෝමයකට ස්වභාවික නීතිය බලපා තිබේ. කෙසේවුව ද ඉතිහාසය පුරාම, ස්වභාවික නීති සම්ප්‍රදාය හා එකඟ නොවූ බොහෝ චින්තකයෝ එම න්‍යාය විවේචනය කළහ.
ස්වභාවික නීති න්‍යාය විසින් කරන ලද වැදගත් දායකවීම් තුනක් සහ එම න්‍යාය වෙත එල්ල කරන ලද ප්‍රධාන විවේචන තුනක් විස්තර කරමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

2. එච්.එල්.ඒ.හාර්ට් විසින් ඉදිරිපත් කරන ලද නීති න්‍යාය නූතන නීති පද්ධතියක් කෙරෙහි අදාළ වන ආකාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. ඔබගේ විශ්ලේෂණය අධිකරණ බලප්‍රදේශ කිහිපයක් ඇසුරින් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

3. හාන්ස් කෙල්සන් විසින් ඉදිරිපත් කරන ලද නිර්මල න්‍යාය තුළ 'මූලික න්‍යාමය' (grundnorm) සංකල්පය අසීරු පශ්චාත්-විප්ලවීය දේශපාලනමය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අත්දැකීම් ඇගයීම සඳහා කෙසේ උපයෝගී කරගෙන ඇත්දැයි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

4. "පොදු නීතිය කෙරෙහි පවත්නා සැබෑ අවදානම වන්නේ නව තත්වයන් සහ නව දැනුම ආවරණය කිරීමට එහි ඇති පෙළඹවීම නොව, සංස්ථිතික (conservative) අධිකරණමය ප්‍රවේශ මගින් එහි ඉදිරි ගමන නවත්වා එය නිශ්චල කරනු ඇතැයි යන සැකය යි."

ස්කාර්මන් සාමිවරයා විසින් *Mc Louglin v. O'Brian* [1983] 1 AC 410, පි.430

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද? විනිශ්චයක භූමිකාව (judicial role) පිළිබඳව රොනල්ඩ් ඩ්වෝර්කින් විසින් ඉදිරිපත් කරන ලද න්‍යාය ඇසුරෙන් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

5. "රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාවලියක් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාවලිය, රටේ සමාජ අරමුණු හා පොදු අභිවෘද්ධිය අරභයා මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස ඇතිකළ මනා සැලසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් ශීඝ්‍ර ලෙස මුළු රට සංවර්ධනය කිරීමට රජය ඇප කැප වී ඇත්තේ ය."

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) 27 (2) (ඇ) ව්‍යවස්ථාව.

'සැලසුම් සහ පාලනය' තුළින් රට සංවර්ධනය කිරීම සහ ජනතාවගේ මානව හිමිකම් වර්ධනය කිරීම අතර තුලනයක් ඇති කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ව්‍යවස්ථාමය ප්‍රයත්නයක් සමාජවිද්‍යාත්මක නීති න්‍යාය උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරන්න.

6. (අ) හෝ (ආ) කොටස් දෙකෙන් එකකට **පමණක්** පිළිතුරු සපයන්න.

(අ) නීතිය තුළ කාන්තාව දෙවැනි ස්ථානයෙහිලා සැලකීම කෙරෙහි අවධානය යොමු කරන කාන්තාවාදී නීති න්‍යාය, කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම් ඇති කරනු ලබන නීති, කාර්ය පටිපාටි සහ ව්‍යුහයන් වෙනස් කිරීමට කැප වෙයි. කෙසේ වුව ද මෙම පොදු අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා විවිධ කාන්තාවාදී මතවාදීන් විසින් වෙනස් ප්‍රවේශ උපයෝගී කරගෙන තිබේ. එවැනි ප්‍රවේශ තුනක් විශ්ලේෂණය කරමින්, කාන්තාවන්ට වෙනස්කම් සිදුකෙරෙන ශ්‍රී ලංකාවේ නීති සංශෝධනය කිරීම සඳහා, ඉන් කවර ප්‍රවේශයක් වඩාත් උචිත වන්නේදැයි පැහැදිලි කරන්න.

(ආ) ලිබරල්වාදී නීති පද්ධතිය තුළ පවත්නේයැයි විවේචනාත්මක නීති ව්‍යාපාරය විසින් හඳුනාගනු ලබන පීඩනය හා වෙනස්කම්කිරීම් සහ ඒ සඳහා විවේචනාත්මක නීතිවේදීන් විසින් ඉදිරිපත් කරනු ලබන විකල්ප ප්‍රතිකර්මය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

7. ජෝන් රෝල්ස් ගේ ව්‍යාප්තික යුක්තිය පිළිබඳව වන න්‍යාය අධික ලෙස පුද්ගලාර්ථවාදී (individualistic) සහ නිදහස් මතධාරී (liberal) වන්නේයැයි විස්තර කරනු ලැබේ.

විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

---------------